සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 11 S

## බුද්ධ ධර්මය - I කොටස

නම .............................................. කාලය පැය දෙකයි

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

✶ අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) ලෝකයේ බුදු කෙනෙකුන් උපදින බවට දෙවියන් විසින් කරනු ලබන ප්‍රකාශය හඳුන්වනු ලබන්නේ,
 i. දේව වාක්‍ය නමිනි.
 ii. බුද්ධ කෝලහාලය නමිනි.
 iii. දේව කෝලහාලය නමිනි.

(2) "ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස" යන්නෙහි තේරුම වන්නේ
 i. "මම ලොවට අග්‍රවෙමි" යන්නයි.
 ii. "මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි" යන්නයි.
 iii. "මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි" යන්නයි.

(3) වප් මඟුල් දිනයේ සිදුහත් කුමාරයා වැඩූ භාවනාව කුමක්ද?
 i. ආනාපානසති භාවනාව
 ii. මෛත්‍රී භාවනාව
 iii. බුද්ධානුස්සති භාවනාව

(4) සිද්ධාර්ථ කුමාරයාගේ ගුරුවරයා වූයේ කවුද?
 i. අසිත තාපසතුමා.
 ii. භග්ගව තාපසතුමා.
 iii. සර්වමිත්‍ර බමුණු පඬිතුමා.

(5) පස්මහ බැලුම් වලට අයත් නොවන කරුණ තෝරන්න.
 i. කාලය
 ii. ජාතිය
 iii. කුලය

✶ අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ හරිනම් ✓ ලකුණද වැරදිනම් X ලකුණද ඉදිරියෙන් තිබෙන වරහනෙහි යොදන්න.

(6) නිබ්බුත පද කීවේ කිසාගෝතමී දේවියයි. ( )

(7) බිම්බිසාර රජතුමාට පාණ්ඩව පර්වතය පාමුලදී සිදුහත් තාපසතුමාව හමුවිය. ( )

(8) සිදුහත් බෝසතාණෝ වසර 5ක් දුෂ්කර ක්‍රියා කළහ. ( )

(9) "යස්ස මූලේ නිසින්නෝව" යන ගාථාව ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන ගාථාවයි. ( )

(10) මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස ගණන 11කි. ( )

✶ අංක 11 සිට 15 දක්වා දී තිබෙන ප්‍රකාශ වල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(සොත්ථිය, සේනානි, දෙවුදහ, කිඹුල්වත්, ඉසිපතනාරාමයේ)

(11) මහාමායා දේවියගේ මව්පියන් වාසය කළේ____________ නුවර ය.

(12) ලුම්බිණි සල් උයනේදී උපන් සිදුහත් කුමරු ___________________නුවරට කැඳවාගෙන ගියේ ය.

(13) බෝසතාණන් වහන්සේ ______________ නියම් ගමෙහි තව්ස් දම් පිරූහ.

(14) පස්වග තාපසයින් සිටියේ ____________________ ය.

(15) බෝසතාණන් වහන්සේට කුසතණ පූජාකළේ __________________ බමුණාය.

පහත සඳහන් **A** හා **B** තීරු ගැලපෙන පරිදි යා කරන්න.

| A | B |
|---|---|
| 16. සිදුහත් බෝසතණාන් වහන්සේ ආසන්න පෙර භවයේ ඉපිද සිටියේ | 1. සැරියුත් තෙරුන් ය. |
| 17. බෝසතාණන් වහන්සේට මනුලොව උපදින ලෙස ආරාධනා කළේ | 2. තුසිත දෙව්ලොව ය. |
| 18. බෝසත් තුමාට හමු වූ තුන්වැනි ගුරුවරයා වූයේ | 3. උද්දකරාමපුත්ත තාපසතුමා ය. |
| 19. බුදුබව ලැබීමට පෙරදින බෝසතණාන් වහන්සේට දානය පූජාකළේ | 4. සහම්පතී මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන් ය. |
| 20. රාහුල හිමියන්ගේ ගුරුවරයා වූයේ | 5. සුජාතා සිටු දේවිය. |

II කොටස

* **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

(01) කෙටි පිළිතුරු ලියන්න.

i. සිදුහත් කුමරුගේ උපත සිදු වූ දිනය හා ස්ථානය සඳහන් කරන්න.

ii. "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" යන්නෙහි අර්ථය ලියන්න.

iii. "මහාභිනිෂ්ක්‍රමණය" යනු කුමක් ද?

iv. වන්දාමි චේතියං සබ්බං - සබ්බ ඨානේසු පතිට්ඨිතං යන ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න.

v. පුබ්බේ නිවාසානුස්සති ඤාණය යනු කුමක්ද?

vi. පස්වග තාපසයින්ගෙන් දෙදනෙකු නම් කරන්න.

vii. බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාවෙන් ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න.

viii. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිසංස දෙකක් ලියන්න.

ix. දියුණුවේ දොරටු සඳහන් වන ජාතක කථාව කුමක්ද?

x. පහත දැක්වෙන වචන වලට ශාසනික වචන ලියන්න.
1. ජලය 2. අතුගානවා

(ලකුණු 2 x 10 = 20)

(02) i. සතර පෙර නිමිති වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

ii. නිබ්බූත පද ලියන්න. (ලකුණු 3යි)

iii. සිදුහත් කුමාරයාගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ 5ක් ලියන්න. (ලකුණු 5යි)

(03) i. විහාරස්ථානයට යනවිට රැගෙන යන දේවල් හතරක් ලියන්න. (ලකුණු 2යි)

ii. විහාරස්ථානයේදී වන්දනා කළයුතු ස්ථාන තුන වන්දනා කරන පිළිවෙල ලියන්න. (ලකුණු 3යි)

iii. පන්සිල් පද පහ පිළිවෙලින් ලියන්න. (ලකුණු 5යි)

(04) i. රාහුල හිමියන් ලැබූ අග තනතුර කුමක්ද? (ලකුණු 2යි)

ii. බුදුරජාණන් වහන්සේ කුඩා රාහුල හිමියන්ට ධර්ම දේශනා කිරීමට යොදාගත් උපමා දෙක ලියන්න.

(ලකුණු 3යි)

iii. රාහුල හිමියන්ගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ 5ක් නම් කරන්න. (ලකුණු 5යි)

(05) i. ඔබ දන්නා භාවනා දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

ii. භාවනා කිරීමට වාඩිවන ආකාර දෙක ලියන්න. (ලකුණු 3යි)

iii. භාවනා කිරීමෙන් ඉගෙනීමේ කටයුතු වලට ඇති ප්‍රයෝජන කෙටියෙන් ලියන්න. (ලකුණු 5යි)

(06) i. දියුණුවේ දොරටු දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

ii. කම්මැලිකම දියුණුවට බාධාවක් වන බවට කරුණු තුනක් ලියන්න. (ලකුණු 3යි)

iii. දියුණුවීමේ දොරටු නිසා අපගේ ඉගෙනීමේ කටයුතු දියුණු වන ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 5යි)

(07) i. පහත දැක්වෙන මාතෘකා වලින් දෙකක් ගැන කෙටි විස්තරයක් කරන්න.

1. රාහුල හාමුදුරුවෝ
2. මහාමායා දේවිය දුටු සිහිනය
3. අපි පන්සල් යමු

# පළමු වාර පරීක්ෂණය - 2019
## බුද්ධ ධර්මය (පිළිතුරු පත්‍රය) 6 ශ්‍රේණිය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | ii | 6. | √ | 11. | දෙවුදහ | 16.-2 | |
| 2. | ii | 7. | √ | 12. | කිඹුල්වත් | 17.-4 | |
| 3. | i | 8. | X | 13. | සේනානි | 18.-3 | |
| 4. | iii | 9. | X | 14. | ඉසිපතනාරාමයේ | 19.-5 | |
| 5. | ii | 10. | √ | 15. | සොත්ථිය | 20.-1 | |

### II කොටස

(1) I. වෙසක් පුරපසළොස්වක පොහෝදින, ලුම්බිණි සල් උයන

II. රාහුලයෙක් උපන්නා ගිහිගෙයි බැම්මක් ඇතිවුණා.

III. බෝසතාණන් වහන්සේ ගිහිගෙය හැරයාම.

IV. සාරීරික ධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා

V. පෙර අත්බව සිහිකරන නුවණ

VI. කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන අයගෙන් දෙදෙනෙක්

VII.
1. ඉවසීමෙන් යුතුව ක්‍රියා කිරීම.
2. තමාගේ අරමුණ වෙනුවෙන් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කිරීම.
3. අනුගමනය කරන ක්‍රමවේදය වැරදි බව හැඟේනම් එහි ම ගැලී නොසිට එය වෙනස් කිරීම.
4. අභියෝග ජය ගැනීම.

VIII.
1. සුවසේ නිදයි.
2. සුවසේ පිබිදෙයි.
3. පාපී සිහින නොදකියි. (පෙළපොත 33 පිටුව)

IX. අත්ථස්සද්වාර ජාතකය

X. 1. පැන්
2. අමදිනවා

(2) I. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්

II. නිසැකවම මේ පුතුගේ මව නිවුණු කෙනෙක්
මේ පුතුගේ පියා නිවුණු කෙනෙක්
මේ හිමිගේ බිරිය නිවුණු කෙනෙක්
(ගාථාව ලියා තිබුණ ද ලකුණු ලබාදෙන්න)

III. මාතෘත්වයට ගරු කිරීම.
හරවත් සිරිත් විරිත් අනුගමනය කිරීම.
යහපත් ක්‍රියාවලදී පූර්ව සූදානම.
ගුරු බසට මැනවින් කන්දීම.
හොඳින් දක්ෂ ලෙස ඉගෙනීම.

(03) I. මල්, තෙල්, හඳුන්කූරු, දැහැත් දානය
(පූජා කිරීමට ගෙනයන දෑ ලිවිය යුතුය. ගිනිපෙට්ටි වැනි දෑ නොලිය යුතුය.)

II. පළමුව - වෙහෙර වහන්සේ
දෙවනුව - බෝධීන් වහන්සේ
තෙවනුව - බුදුපිළිම වහන්සේ

III. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(04) I. ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුර
II. පැන් භාජනය හා කැඩපත
III. පෙළපොතේ 39 පිටුවේ තිබෙන ආදර්ශ ලියා තිබිය යුතුය.
කීකරු කම, අවවාද පිළිගැනීම, ඇත්ත කථා කිරීම, හරි වැරදි හඳුනා ගැනීම, අනතිමානී බව.

(05) I. මෛත්‍රී භාවනාව
ආනාපානසති භාවනාව යනාදී වශයෙන් ලියූ කරුණු දෙකකට ලකුණු ලබාදෙන්න.
II. පිරිමි ළමුන් - බද්ධ පර්යංකය
ගැහැණු ළමුන් - අර්ධ පර්යංකය
III. සිත පිරිසිදු වීම නිසා පාඩම් කරන දේ මතක තබා ගැනීම පහසු වීම.
කම්මැලි නැතිව පාඩම් කටයුතු කළ හැකි වීම ආදී වශයෙන් ලියා තිබෙන පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.

(06) I. සීලාචාරකම (සීලං)
වැඩිහිටි උපදෙස් හා අනුමැතිය ලබාදීම (වුද්ධානුමතං)
බහුශ්‍රැත කම (සුතං)
දැහැමිව ජීවත් වීම. (ධම්මානුවත්තී)
කම්මැලි නැතිකම (අලීනතා)
II. කම්මැලි වීමෙන් කටයුතු අතපසු වීම.
කාලය නිකරුනේ විනාශවීම.
දක්ෂතා දියුණු නොවීම.
**ගැලපෙන කරුණු සලකා ලකුණු ලබාදෙන්න.**
III. සිසුවාගේ පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.

(07) සිසුවාගේ පිළිතුර සලකා ලකුණු ලබාදෙන්න.